


**මෙම සමාගමේ දිවයින පුරා පිහිටි ජාත්‍යන්තර ගුවන් තොටුපොල වල පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පී (හැන්ඩිමන්) 11 වන ශ්‍රේණිය තනතුර

**රැකියාවේ ස්වභාවය** : ගුවන් තොටුපොල පරිශ්‍ර සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන, නිල නිවාස හා සමාගමට අයත් අනෙකුත් පරිශ්‍රවල පවතින සිවිල් නඩත්තු කටයුතු, ජලනල කටයුතු සහ පැස්සුම් කටයුතු ආදිය අවශ්‍ය විටදී අංශ ප්‍රධානී හෝ බලයලත් නිළධාරියෙකු විසින් ලබා දෙන උදෙස් පරිදි ක්‍රියා කිරීම.

**රැකියාවේ වගකීම්** :

- I වඩු කාර්මික උපකරණ සම්බන්ධයෙන් සාමාන්‍ය දැනුමකින් යු.තුව එකී කටයුතු වල නියැලීම.
- II දොර ජනෙල් සවිකිරීම, ගැලවීම.
- III දොර අගුළු (Lock) සවි කිරීම , දෝෂ සැකසීම.
- IV ඇළුමිනියම් දොරවල් ජනෙල් සවිකිරීම, අගුළු සකස් කිරීම.
- V ජලනල කාර්මික උපකරණ භාවිතයෙන් ඒ පිලිබඳ කටයුතු වල නියැලීම.
- VI ජලමනු කියවීමට හැකිවීම
- VII ජල කරාම, ජලනල දෝෂ සකස් කිරීම.
- VIII පැස්සුම් කටයුතු හා සම්බන්ධ උපකරණ භාවිතා කරමින් ඊට අදාළ කටයුතු වල නියැලීම.
- IX පැස්සුම් වැඩ කිරීම.
- X සාමාන්‍ය පෙදරේරු කටයුතු ඉටු කිරීම.
- XI බදාම මිශ්‍රන සාදා ගැනිම (උදා : -කපරාරු කිරීම, බිත්ති බැදීම, කොන්ක්‍රීට් මිශ්‍රණ)
- XII පින්තාරු වැඩ සඳහා තීන්ත මිශ්‍රණය සාදා ගැනිම.
- XIII පොට් ඇදීම හා කැපීම අවශ්‍ය පරිදි මතුපිට සකසා ගැනිම.
- XIV අංශ ප්‍රධානී හෝ වෙනත් බලයලත් නිළධාරීන් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් ඉටු කිරීම.

01. **සුදුසුකම්** :

(අ) කාර්මික විද්‍යාලයක් මලින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.C.E) විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන එක් අවුරුදු (01) පූර්ණකාලීන පාඨමාලාවක් පෙදරේරු/ ජලනල සහ පින්තාරු ක්ෂේත්‍රයෙන් සාර්ථකව හදාරා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) වෘත්තීය සහතිකයක් පෙදරේරු/ ජලනල සහ පින්තාරු ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද/පුහුණු කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

02. වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

03. වැටුප : තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

04. **බඳවා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ වාචික පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2026 **මැයි මස 18 වන දිනට** පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

---

**සභාපති**
**ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ**
**කටුනායක**

Adv.03/05/2026